පල්ලේපොල ප්‍රාදේශීය සභාව - 2023
--------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂය වෙනුවෙන් එම වර්ෂයේම ලැබී තිබුණු රු.191,235 ක උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායම් සේ සළකා දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්වල ගැලපීම් කර නිවැරදි කරන බව. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පෙර පාසැල් කුලී සහ පුරනැගුම ගොඩනැගිල්ලේ කුලී ආදායම එකතුව රු.46,054 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,805,368 ක වත්කම් විෂයයන් 03 ක සහ රු.2,633,724 ක බැරකම් විෂයයක ස්ථාවර වත්කම් ලේඛන, ගබඩා ලේඛන සහ ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කර තොරතුරු සොයා බලා 2024 වර්ෂයේ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ වලට අදාල ලේඛණගත තොරතුරු පිළියෙල කල යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(3) (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවෙහි ප්‍රාදේශීය සභාව ඉටුකර ගත් අරමුණු, අනාගත අපේක්ෂා, ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්පත් භාවිතා කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි . | 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පිළියෙල කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | රීති<br>1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වර්ෂය ආරම්භයේදී සමීක්ෂණයක් සිදුකර ලැයිස්තුවක් පිළියෙළ කර නොතිබුණි. | 2024 වර්ෂය වෙනුවෙන් බලපත්‍ර හා ව්‍යාපාර බදු සඳහා සමීක්ෂණයක් සිදුකරමින් පවතින බව | රීතිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | පළාත් පාලන ලිපි<br>--------------------- | | | |
| | 2021 නොවැම්බර් 12 දිනැති අංක සීපීසී/සීඑල්ජී/1/3/2/3 ලිපිය දරන ලිපියේ 03 ඡේදය | ට්‍රැක්ටර් ටේලරයක් රු.870,289 ක් ගෙවා අළුත්වැඩියා කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ලිපියේ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,916,319 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,403,216 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම් | **බිල්කළ ආදායම** | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | **රු.** | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (I) | වරිපනම් හා බදු | 2,559,600 | 2,441,566 | 2,466,260 | 433,954 | 3,469,600 | 1,540,208 | 1,520,113 | 500,480 |
| (II) | කුලී | 5,949,000 | 4,776,939 | 4,499,260 | 548,710 | 5,958,000 | 3,988,182 | 3,690,591 | 271,062 |
| (III) | බලපත්‍ර ගාස්තු | 1,560,000 | 1,035,580 | 1,035,580 | - | 1,312,000 | 801,396 | 921,596 | - |
| (IV) | වෙනත් ආදායම් | 46,914,500 | 26,890,656 | 32,870,465 | 14,731,094 | 39,634,500 | 28,524,412 | 25,732,119 | 21,259,261 |
| | එකතුව | 56,983,100 | 35,144,741 | 40,871,565 | 15,713,758 | 50,374,100 | 34,854,198 | 31,864,419 | 22,030,803 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | ඒකකයක හිඟ හිටි වරිපනම් ශේෂය රු.5,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 11 කින් වසර 2 සිට වසර 18 අතර කාල පරාසයක සිට අය නොවී පැවත එන හිඟ හිටි වරිපනම් රු.84,071 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේ අය කරන බව. | හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.883,893 ක් හා මුද්දර ගාස්තු රු.11,008,795 ක් විය. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ජල සාම්පල් පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 06 න් 04 ක ජලය බීමට නුසුදුසු බව තහවුරු වී තිබුණි. එම පරීක්ෂණ වාර්තාවට අනුව ජලයේ ගුණාත්මක බව වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 1576 ක් වූ ජල පාරිභෝගිකයින්ට ප්‍රමිති තත්ත්වයෙන් යුත් පිරිසිදු ජලය ලබා දීමට සභාව අපොහොසත් වී තිබුණි. | ජල මූලාශ්‍රන්හි ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | පිරිසිදු පානීය ජලය නිකුත් කල යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.42,263,812 ක් විය. ඉන් වසර 1 ත් වසර 5ත් අතර කාල පරාසයක එකතුව රු.41,699,551 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂවල එකතුව රු.550,035 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් අයකර ගත යුතුය . |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවියයුතු සංවර්ධන ව්‍යාපෘති ණයහිමි ශේෂය රු. 53,637,875 ක් විය. ඉන් වසර 1 ත් වසර 5ත් අතර කාල පරාසයක එකතුව රු.41,485,941 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරිමට කටයුතු කල යුතුය . |
| (ඇ) | ලී බඩු හා කාර්යාල උපකරණ ඒකක 59 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි අවසන් ගිණුම්වලට ඇතුලත් කිරිමට කටයුතු කරන බව | ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම්ගත කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සිට 2022 අතර කාල පරාසය තුළ ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර 196 ක් අනුමත කර තිබුණද, ඉන් ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර 158 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. එම කාලය තුළ අනුමත නොකල අයදුම්පත් 52 ක් සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අඩුපාඩු සම්පූර්ණ නොකිරීම මත අනුමත කර නොමැති බව. | අනුකූලතා සහතික නිකුත් කලයුතු අතර පසුවිපරම් කටයුතු කලයුතුය. |
| (ආ) | සභාවට අයත් ජල යෝජනා ක්‍රම 06 ක විගණිත දිනට ජල මීටර 88 ක් අක්‍රීය වී තිබුණද, එම අක්‍රීය වූ ජල මීටර් අළුත්වැඩියා කිරීම හෝ ඒ වෙනුවට නව ජල මීටර් සවි කිරීමට හෝ කටයුතු නොකර ජල පාරිභෝගිකයින්ගෙන් රු.950 ක ස්ථාවර ජල ගාස්තුවක් පමණක් අය කර තිබුණි. | ස්ථාවර ජල ගාස්තුවක් පමණක් අය කරන බව | ජල මීටර් සවිකර ගාස්තු අයකල යුතුය. |

## 3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් එකතුව රු.3,826,818 ක කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02 ක් හා වාහන 03ක් වසර 2 ත් 15 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි. | වෙන්දේසි කිරීම සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට පළාත් පාලන ඉංජිනේරු වෙත යොමුකර ඇති බව . | වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාබල ප්‍රදේශය තුල සභාව පරිහරණය කරන රු. 972,961 ක සුසානභූමි හා වෙනත් අක්කර 13 රූඩ් 2 පර්චස් 18.5 ක වපසරියකින් යුත් ඉඩම් කැබලි 16 ක , අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.. | මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාල ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවකයින් පස් දෙනෙකු නිත්‍ය තනතුරෙන් බැහැරව කාර්යාල කටයුතු හා වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි. මේ හේතුවෙන් මාර්ග නඩත්තු හා සංවර්ධන කටයුතු සහ පුස්තකාල කටයුතු ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමේ ගැටළුවක් පවතින බවක් නිරීක්ෂණය විය. | දැනට සිටින කාර්ය මණ්ඩලය ආයතනික රාජකාරී කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බව | සේවකයින් නිත්‍ය රාජකාරියේ යෙදවිය යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| | | |
| --- | --- | --- |
| අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන ප්‍රමුඛතාගතකර ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල නොකර සංවර්ධන ව්‍යාපෘති 42 ක එකතුව රු.16,800,000 ක ඇස්තමේන්තු අගයක් ඇතුළත් කර අයවැය ලේඛනය පිළියෙල කර තිබුණි. එමෙන්ම අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සංවර්ධන ව්‍යාපෘති, අවස්ථා ගණනාවකදී මහා සභාව විසින් සංශෝධනය කර තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තු මත සංවර්ධන ව්‍යාපෘති සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව | ඉංජිනේරු ඇස්තමේන්තු ලබාගෙන අයවැය පිළියෙල කල යුතුය. |